ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date: 10th May 2021. |

පැමිණිලි පාර්ශවය : ඒ. ප්‍රේමලතා මිය.
අංක : 377/1, දංගස්වලවත්ත,
තිබ්බටුවාව,
ඇහැලියගොඩ.

අගතියට පත් තැනැත්තා : මාතර ගමගේ ආනන්ද මයා

වගඋත්තර පාර්ශවය : උ.පො.ප. අතපත්තු මයා,
පොලිස් ස්ථානය,
ඇහැලියගොඩ.

<u>පැමිණිලි අංකය : **HRC/2953/17**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා වන මාතර ගමගේ ආනන්ද යන අයව 2017.09.18 වන දින රාත්‍රී 7.30 ට පමණ වගඋත්තරකරු විසින් අත්අඩංගුව ගෙන වධහිංසාවට ලක් කර ඇති බවත්, ඔහුගේ ශරීරයේ තුවාල සහ දත් දෙකක් කැඩී යන ආකාරයට පහරදී ඇති බවත්ය.

අගතියට පත් මාතර ගමගේ ආනන්ද යන අය ප්‍රකාශ කර ඇත්තේ, තමා පෙදරේරුවරයෙක් බවත්, 2017.09.18 වන දින නවගමුව ප්‍රදේශයේ වැඩකට ගොස් නැවත නිවසට එන අතරතුරදී තමා විසින් පොලියට ලබාගත් මුදලක් නැවත භාරදීම සඳහා කුමාර නැමති අයගේ නිවසට ගිය බවත්, එම නිවසේ නීති විරෝධී මත්පැන් විකුණන බවට තමා දන්නා බවත්, තමා මුදල් දී නැවත එනවිට සිවිල් ඇදුමින් සැරසී සිටි අයකු කළුවරේම තමාව අල්ලාගත් බවත්ය. එවිට තමා ඔහුගේ අත ගසා දැමූ බවත්, එවිට ඔහු කෑ ගසමින් "මට ගහනවෝ, දුවන්න හදනවෝ" ලෙස ප්‍රකාශ කල බවත්, ඔහු එසේ කියමින් තමාගේ මුහුණට පහර දුන් බවත්ය. පසුව තමාව පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් 2017.09.19 වන දින අධිකරණයට ඉදිරිපත් කල බවත්,

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන | | ලේකම් | | ක්ෂණික | | වෙබ් | |

අධිකරණයෙන් ඇප මත නිදහස් වූ බවත්ය. පසුව අවිස්සාවේල්ල රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

මෙම අගතියට පත් තැනැත්තා කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, වගඋත්තරකරු සමග අදාල පැමිණිල්ල සමථයකට පත් වූ බැවින්, තවදුරටත් මෙම පැමිණිල්ල ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය නොමැති බව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර උ.පො.ප අතපත්තු යන අය මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2018.09.18 වන දින තමා විසින් ස්ථාන කිහිපයක් වැටලීම් සිදුකල බවත්, එම වැටලීමකට ගොස් සිටියදී මාහින්ගොඩ, ගාමිණී හෝල් එක ඉදිරිපිට කුමාර යන අයගේ නිවස අසල රුකවල් ලා ගෙන සිටියදී මෙම සැකකරු අත්අඩංගුවට ගත් අතර, එම අවස්ථාවේදී සැකකරු අත්අඩංගුවෙන් මිදී පලායාමට උත්සහ කල බවත්ය. ඔහුව පාලනය කිරීම සඳහා අවශ්‍ය බලය යෙදවීමට සිදුවූ බවත්, එහිදී තුවාල ඇතිවූ නිසා පසුදින මොහු ඇහැලියගොඩ රෝහලට ගෙන ගොස් බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබාදීමට කටයුතු කල බවත්, එදිනම අධිකරණය වෙත ඉදිරිපත් කල බවත්ය. ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු ලග ගංජා තිබූ බවත්, මෙම චෝදනා යටතේ ඔහුව අධිකරණයට ඉදිරිපත් කර මහේස්ත්‍රාත් නඩු අංක 17668 යටතේ නඩු පවරා ඇති බවත්, එම නඩුවේ වරද පිළිගෙන රු. 10,000/- දඩයක් නියම කර ඇති බවත් සඳහන් කරන අතර, තමා මෙම සැකකරුට පහර නොදුන් බවත්, අත්අඩංගුවෙන් පැනයාමට උත්සහ කිරීමේදී එය වැලැක්වීම සඳහා අවශ්‍ය බලය පාවිච්චි කල බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරු විසින් යොදවන ලද බලය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේදී ප්‍රකාශ කර ඇත්තේ, අනෙක් නිලධාරින්ගෙන් මිදී දුවයන අවස්ථාවේදී මෙම සැකකරුව අල්ලාගෙන බිම පෙරලාගත් බවත්, එවිට ඔහු බිම ඇද වැටුනු බවත්, එම වැටීම මත බිම වැදී දත් බිදී ඇති අතර, සීරීම් තුවාල ද සිදුව ඇති බවත්ය.

අධිකරණ වෛද්‍ය වාර්තාව =:

පහරදීම සම්බන්ධයෙන් තහවුරු කර ගැනීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, අවිස්සාවේල්ල මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සිදුකර ඇත. බරපතල නොවන එක් තුවාලයක් ද, බරපතල තුවාල දෙකක් ද ඇති බවට වෛද්‍ය වාර්තාවේ සඳහන්ව ඇත. රෝගියා විසින් කරන ලද කෙටි ඉතිහාසයේදී සඳහන් කර ඇත්තේ, තමාට ටෝච් එකකින් මුහුණට ගැසූ බවත්, කටින් ලේ ආ බවත්ය. වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ එම තුවාල මොට ආයුධයකින් පහරදීම මත සිදුවී ඇති තුවාල බවයි.

නිරීක්ෂණ :-

අගතියට පත් පාර්ශවය වන මාතර ගමගේ ආනන්ද යන අය අදාළ වැටලීමේදී අත්අඩංගුවට ගත් බවට වගඋත්තරකරු විසින් පිළිගෙන ඇත. එසේම, අත්අඩංගුවට ගැනීමේදී සැකකරු පලායාමට තැත් කල නිසා බලය පාවිච්චි කිරීමක් සිදුකළ බව ද වගඋත්තරකරු විසින් පිළිගෙන ඇත.

වින්දිතයා විසින් ගංජා ලග තබාගැනීමේ චෝදනාවන්ට වරදකරු බවට අධිකරණය ඉදිරියේදී පිළිගෙන ඇත. තවද, වින්දිතයා විසින් මෙම පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව මොට ආයුධයකින් පහරදීමක් සිදුකර ඇති බවට වෛද්‍යවරයා නිගමනය කර ඇති අතර, එම වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාලයක් සහ බරපතල තුවාල දෙකක් ඇති බව සඳහන් වේ. එනම්, බරපතල තුවාල යටතේ වින්දිතයාගේ කට පැලී තුවාල වීම සහ ඉදිරිපස දත් දෙකක් කැඩී ගොස් ඇති බවට දක්වා ඇත.

නිගමනය :-

වින්දිතයාව අත්අඩංගුවට ගෙන ගංජා ලග තබා ගැනීමේ චෝදනාව මත අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, අධිකරණය ඉදිරියේදී වරද පිළිගෙන ඇති බැවින් අත්අඩංගුවට ගැනීම තුලින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට තහවුරු කිරීමේ හැකියාවක් නොමැති බවට නිගමනය කරනු ලැබේ.

වින්දිතයා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පහරදීමක් සිදුවීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති කිසියම් පුද්ගලයෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකල යුතු බවට දක්වා ඇති විධිවිධාන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව දක්වා ඇති 11 වන ව්‍යවස්ථාව මගින් එම ව්‍යවස්ථාවට වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් ඇති අතර, මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා **2/3** ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක්ද අවශ්‍ය වන බැවින්, මෙම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට ඇති මෙම මූලික අයිතිවාසිකම සුවිශේෂී තත්ත්වයකි. <u>අමල් සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු</u> නඩුවේදී ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ බව තවදුරටත් සහතික කර ඇත.

වධහිංසාව සහ වෙනත් කෲර අමානුෂික වූ අවමන් සහගත දඬුවමට එරෙහි සම්මුතිය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 05 වන වගන්තිය හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 7 වන ව්‍යවස්ථාව මගින් සෑම මනුෂ්‍යයෙකුම කෲර හා අවමන් සහගත සැලකිල්ලකට භාජනය වීමෙන් සෑම තැනැත්තෙක් ආරක්ෂා කිරීමට රජයක් බැඳී සිටින බැවින් ද, එය බරපතල ගණයේ අපරාධයක් බවට නීතිය ඉදිරියේ පිළිගෙන ඇති බැවින් ද, මෙම වරද සම්බන්ධයෙන් සමථයකට පත්වීමට කිසිදු පාර්ශවයකට හැකියාවක් නොමැත.

නිර්දේශය =:

01. ඒ අනුව වින්දිතයාගේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් වින්දිතයා වෙත රු. 30,000/- ක වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද, මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලබන අතර, වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් පියවර ගත යුතු බවටද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.06.30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Sh... ...anathan
Commiss...
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/